www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෂැංහයි සහයෝගීත්ව සංවිධානය (එස්සීඕ) ජෝර්ජියාව පිලිබඳ රුසියානු පිලිවෙත ප්‍රවේශමෙන් අනුමත කරයි

## Shanghai Cooperation Organisation cautiously endorses Russia over Georgia

**ජෝන් චාන් විසිනි**
**2008 සැප්තැම්බර් 03**

අගෝස්තු මස 28 වැනි දින තජිකිස්තානයේ දී ෂැංහයි සහයෝගීත්ව සංවිධානයේ වාර්ෂික සමුලුව ඇරඹීමටත් පෙර දී ම රුසියානු - ජෝර්ජියානු ගැටුම න්‍යාය පත්‍රයේ ප්‍රමුඛත්වය ගනු ඇති බව පැහැදිලි විය. රැස්වීම ආරම්භයේ දී ම මොස්කෝව ජෝර්ජියානු පලාත් වන දකුනු ඔසෙටියාව හා අබ්කාසියාව ස්වාධීන රාජ්‍ය ලෙස මුලුමනින් ම පිලිගැනීම ප්‍රකාශයට පත් කලේ ය. එක්සත් ජනපද හා යුරෝපා බලවතුන්ගේ තර්ජන මධ්‍යයේ රුසියාව තම එස්සීඕ මිත්‍රයින්ගේ විශේෂයෙන් ම චීනයේ සහයෝගය බලාපොරොත්තු වූයේ ය.

එස්සීඕ ව 2001 දී චීනය, රුසියාව හා මධ්‍යම ආසියාවේ සමූහාන්ඩු හතරත් - කසක්ස්තානය, කිර්ගිස්තානය, තජිකිස්තානය හා උස්බෙකිස්තානය - එක්ව පිහිටුවන ලදී. නිල වශයෙන් එහි අරමුන වූයේ "ත්‍රස්තවාදයට " හා බෙදුම්වාදයට එරෙහිව සටන් කිරීමයි. එහෙත් එහි යථා අභිප්‍රාය වූයේ චීන - රුසියානු සබඳතා වඩා ශක්තිමත් කරමින් මධ්‍යම ආසියාව තුල එක්සත් ජනපද මැදිහත් වීම අහිමුඛ කිරීම ය. එස්සීඕව නැටෝවට පවා එරෙහි දේශපාලන මිලිටරි පෙරමුනක් ලෙස වර්ධනය විය හැකි බව පසු ගිය වසර කීපයේ දී බොහෝ බටහිර නිරීක්ෂකයින් විසින් ප්‍රකාශ කර තිබුනි. රුසියාවේ යුද ශක්තිය හා තෙල් ද චීනයේ වැඩෙන්නා වූ ආර්ථික ශක්තිය ද මධ්‍යම ආසියාවේ සැලකිය යුතු බලශක්ති සම්පත් සහිත එස්සීඕව එහි නිරීක්ෂකයින් ලෙස සහභාගි වූ ඉරානයේ, ඉන්දියාවේ, පකිස්තානයේ හා මොන්ගෝලියාවේ උත්සුකතාවයන් ආකර්ශන කර ගෙන ඇත.

එස්සීඕ හි ඒකාබද්ධ ප්‍රකාශය ජෝර්ජියාව වෙත යොමු වීම අනපේක්ෂිත වූවක් නො වේ. ජෝර්ජියාවට එරෙහි මොස්කව් ක්‍රියාකලාපය ට එහි සියලු සාමාජික රටවල් සහයෝගය දක්වන "එක්සත් ස්ථාවරයක්" සමුලුවේ දී ගත් බව ප්‍රකාශ කිරීමට රුසියන් ජනාධිපති ව්ලැඩිමර් මෙඩ්වෙඩෙව් සමුලු ප්‍රකාශනය ඩැහැගත්තේය. "කලු සුදු කිරීමටත් මෙම ආක්‍රමනය (රුසියාවට එරෙහි) යුක්ති සහගත කිරීමටත් උත්සාහ ගන්නන්ට එරෙහිව එය බරපතල සංඥාවක්ලෙස සේවය කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි"යි මෙඩ්වඩෙව් ප්‍රකාශ කලේ ය. එස්සීඕව එක්සත් බවින් බොහෝ දුරස්ථ බව ඒකාබද්ධ ප්‍රකාශනය හඟවයි. වෙන්වී ගිය ජෝර්ජියානු පලාත් දෙක තමන් විසින් පිලිගැනීම පිලිබඳව රුසියාව චීනයෙන් කිසිදු පිටුබලයක් ලැබුවේ නැත. වඩාත් ඉස්මතු වූයේ රුසියාව හා චීනය අතර සම්මුතියකි. එක් අතකින් එස්සීඕ ප්‍රකාශය, "කලාපයේ සාමය හා සහයෝගිතාවයට රුසියානු ක්‍රියාකාරී භූමිකාව ට සහාය දැක්වී ය." එහෙත් අනෙක් අතට දකුනු ඔසෙටියා ප්‍රශ්නය වටා මෑත ආතතිය පිලිබඳව බලවත් කනගාටුව ද සාකච්ඡා මගින් පවතින්නාවූ ගැටලුව සාමකාමීව විසඳ ගැනීම සහායදීමේ අදාල පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටියේ ය.

රුසියා ජෝර්ජියා ගැටුම ද ඊට පසු රුසියානු-එක්සත් ජනපද ආතතියේ නැගීම ද රුසියාව සමග සබඳතාවලට චීනයේ කැප වීම පිලිබඳ පරීක්ෂාවකි. මධ්‍යම ආසියාවේ චීනයට අයත් විශාල ප්‍රදේශයක් බලගතු විරුද්ධ බලවේගයනට විවෘත කෙරෙමින් බටහිර පීඩනය යටතේ රුසියානු බලපෑම දුර්වල වනවා දැකීම බීජිනයට දැරිය නොහැක. ඒ අතර ම චීනයේ විශාලත ම ආර්ථික හවුල්කරුවන් වන එක්සත් ජනපදය හා යුරෝපය සමග ගැටුමකට ඇදගෙන යමින් පවතී යයි චීනය බිය වෙයි.

දකුනු ඔසෙටියානු හා අබ්කාසියාවෙත් නිදහස චීනය තුල ම බෙදුම්වාදී බලවේග දිරිමත් කරනු ඇතැයි චීනය කනස්සලු වෙයි. එස්සීඕ සමුලුව ආසන්නයේ දී ම විදේශ අමාත්‍යංශ ප්‍රකාශක කුයින් ගැන්ග් ප්‍රවේශමෙන් එම කනස්සල්ල ප්‍රකාශ කලේ යඃ "දකුනු ඔසෙටියා හා අබ්කාසියා කාරනාව පිලිබඳ සංකීර්න ඉතිහාසය හා යථාර්තය පිලිබඳව අප මුලුමනින්ම දැනුවත් ය, එවැනි කාරනා පිලිබඳ අපගේ ස්ථාවර ආස්ථානය අනුව, සංවාද හා උපදේශනාවන් මගින් අදාල රටවල කාරනා හොඳින් විසඳා ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු."

ටිබෙටයේ හා මෑත මාසවල දී මුස්ලිම් උයිගර් සටන්කාමීන් පහරදීම් කර ඇති ෂින්ගි පලාතේ බෙදුම්වාදී ව්‍යාපාරවලට බීජිනය මුහුන දී ඇත. එස්සීඕ සමුලුවට මොහොතකට පෙර පොලිස් බටයන් දෙදෙනෙකු මරා දමන ලදී. ෂින්ජියැන්ග් විශාල ලෙස තෙල් හා ගෑස් සම්පත්වලින් පොහොසත් වන අතර ම

මධ්‍යම ආසියාවේ සිට චීනය දක්වා වන බල ශක්ති නල මාර්ගයන්ගේ කොරිඩෝව ද වේ. එක්සත් ජනපද හා අනෙකුත් බටහිර බලවේග ප්‍රාදේශීය නැගිටීම් හමුවේ ඔවුන්ගේ බලපෑම් වැඩි කර ගැනීමට වාසියක් ලෙස යොදා ගනු ඇතැයි චීනය බිය වෙයි.

චීන ජනාධිපති හූ ජින්ටාවෝ සමුලුවේ දී පැහැදිලිව ම තුලනයක් සොයමින් සිටියේ ය. ජෝර්ජියානු ප්‍රශ්නය නිසා 2014 දී රුසියවේ දී සීත ඍතු ඔලිම්පික් තරග වර්ජනය කිරීමට එක්සත් ජනපදය හඬ නැගීම මධ්‍යයේ රුසියානු නගරයක් වන සෝචිහි දී තරග පැවැත්වීමට ඔහු ප්‍රසිද්ධියේ ම චීනයේ සහාය පල කලේ ය. මාර්තුවේ දී ටිබෙටයේ පැවති විරෝධතාවන් මට්ටු කිරීමෙන් පසු බිජිං ඔලිම්පික් සමාරම්භක උත්සවය වර්ජනය කිරීමට යුරෝපීය නායකයින් තර්ජනය කල විට රුසියාව චීනයට ප්‍රබල සහයෝගයක් ප්‍රකාශ කලේය. එස්සීඕ සමුලුවට සහභාගිවූ මධ්‍යම ආසියානු සමූහාන්ඩු ද රුසියානු ක්‍රියාවන්ට මේ සමාන ම ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත් කලහ. කලාපයේ ඊනියා වර්න විප්ලවයට වොෂින්ටනය සහයෝගය පිලිබඳ සැලකිලිමත්වන අතර ම ඔවුන්ගේ දැවැන්ත අසල්වාසීන් දෙදෙනාගේ - චීනය හා රුසියාව - ආධිපත්‍යය යටතේ සිටීමට සිදු වෙතැයි තමන්ගේ ම බෙදුම්වාදී තරජනයන්ට ද මුහුන දීමට සිදු වනු ඇතැයි මේ රටවල් තුල බියක් පවතී

මොස්කෝවට සහාය දෙන්නවුන්ගේ ප්‍රමුඛයෙකු වන කසාක්ස්ථානයේ ජනාධිපති නූර්සුල්තාන් නෂර්බයෙව් මෙසේ ප්‍රකාශ කලේ යඃ " ජෝර්ජියානු සන්නද්ධ හමුදා සාමකාමී ට්ස්කිත්වලී නගරයට පහර දීම බටහිර නිකම්ම නොසලකා හැරීම මා මවිතයට පත් කරවයි. ඉන් පසු රුසියාව විසින් ගනු ලැබූ පියවර දීර්ඝ කාලයක් විඳවන මෙම නගරයේ සාමාන්‍ය ජනයා මත ලේ වැගිරීම් වැලැක්වීමට රුසියාව සැලසුම් කර තිබූ ඒවා බව මම විශ්වාස කරමි." කෙසේ නමුත් මොස්කෝව විසින් වෙන්ව ගිය ජෝර්ජියානු ප්‍රදේශ දෙක පිලිගැනීමට ඔහු ඍජුව සහාය නොදුන්නේ ය.

## මූලෝපායික එදිරිවාදිකම්

එස්සීඕ පූර්න සහාය රුසියාවට නොමැති බව මොස්කෝව දන්නේය. රුසියානු ජනාධිපති මෙන් ම රුසියානු කොමියුනිස්ට් පක්ෂ නියෝජ්‍ය සභාපති ඉවාන් මෙල්නිකෝව් ද එස්සීඕ ප්‍රකාශය " ජාත්‍යන්තරවශයෙන් රුසියාව හුදකලා වීම පිලිබඳ සියලු සමපේක්ෂනයට තිත තැබූ" බව අවධාරනය කරයි.

නැටෝව සමග ගැටුමේ දී එස්සීඕ ප්‍රකාශය රුසියාව හුදකලා කල බව පෙන්වමින් කොමසාන්ට් පුවත්පත තරමක් අසුබවාදී වේ. එස්සීඕ රාජ්‍යයන් රුසියාව වෙත තම හිතවත්කම ප්‍රකාශ කර තිබුනත් " ඔවුන්ගේ ස්ථාවරය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට නොහැකි වීම ගැන කනගාටුවෙනවා" යි ජ්‍යෙෂ්ට රුසියානු නිලධාරියෙකුගේ කියමන එය උපුටා දක්වයි. යෝජනාවේ සැර බාල කරනු සඳහා, ජෝර්ජියානු හමුදාවේ දකුනු ඔසටේසියාව වෙත වූ ආරම්භක ආක්‍රමනය හැඳින්වූ ජනසංහාරය යන වචනය ඉවත් කිරීමට චීනය බල කර ඇති බව විචාරකයෙකු පුවත්පතට ප්‍රකාශ කලේය.

"බිඳී ගිය පලාත් පලිගැනීමෙ තීරනය ගත්විට එස්සීඕ හවුල්කරුවන් ඒ ගැන සතුටු නොවන බව රුසියාව දැන සිටියා ය. කෙසේ වෙතත් ලියොනිඩ් බ්‍රෙෂ්නෙව් සහෝදරයාගේ (පැරනි සෝවියට් නායක) කලෙයේ දී මෙන් මොස්කෝව මෙම කාරනයට සහාය දීමට කිසිම රටකට බල කිරීමට උත්සාහ නොකරයි. එය කලා නම් එයට තරමක හිතවතුන් කීප දෙනෙකු සොයාගැනීමට ඉඩ තිබුනි. නමුත් කවුද සලකන්නේ. සමහර රටවලට එවැන් 'උදව්' පුරුද්දට මෙන් එකිනෙකාට වෙනස් ගැනුම්කරුවන්ට අලෙවි කරන භාන්ඩයක් පමනි." රජයේ නොවොස්ති ප්‍රවෘත්ති සේවයේ දේශපාලන විචාරකයෙකු වන ද්මිත්‍රි කොසයිරෙව් සඳහන් කලේ ය.

රුසියානු රජයේ ප්‍රකාශකයෙකු වන ද්මිත්‍රි පෙස්කොව්, බීජිංවල ස්ථාවරයේ අරථය චීනය විසින් රුසියාව හුදකලා කිරීම නොවන බව පවසමින් ඒස්සීඕ සමුලුවේ වෙනස්කම්වල සැර බාල කිරීමට උත්සාහ ගත්තේ ය. එසේ වුවත් වොෂින්ටනය හා අනෙකුත් බටහිර රටවල්, චීනයේ ඉරියව් පිලිබඳ සනිටුහන් කර ගෙන ඇත. "චීනය බටහිර විවේචක කන්ඩායම සමග එකතුවී නොමැත. නමුත්, බෙදුම්වාදී ප්‍රාන්ත පිලිගැනීම පිලිබඳව වෝල්ස්ට්‍රීට් ජර්නල් නිරීක්ෂනය කලේ චීනයේ නොසනසුන්කම මොස්කව් හා බීජිං අතර වූ කිට්ටු රාජ්‍ය තාන්ත්‍රික හවුල්කාරිත්වය අනතුරේ හෙලයි."

අගෝස්තු 27 ෆිනෑන්ෂල් ටයිම්ස් මෙසේ ලියයිඃ

"මෙම ප්‍රාන්ත දෙක පිලිගැනීම සඳහා කෙදිනක හෝඑක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් වුවහොත් එක්සත් ජනපදය නිෂේධ බලය පාවිච්චි කිරීමට ඉඩ ඇතැයි යන අවබෝධය තුල සුරක්ෂිතව චීනෙට බාගෙට මුහුන පෙන්නා ගෙන සිටිය හැක. නමුත් චීනයට අවශ්‍ය අන්තිම දෙය තියුනු වූ යුද්ධයයි. තමන්ට පැත්තක් ගැනීමට බලකෙරෙන නව සීතල යුද්ධයක කරදරයෙන් බේරීමට චීනයට අවශ්‍ය ය."

1960 ගනන්වල චීන-රුසියානු බෙදීම දෙසට ඇඟිල්ල දිගු කරමින් ෆිනෑන්ෂල් ටයිම්ස් තව දුරටත් මෙසේ කියයිඃ "දෙරට ම දැනට අධිපතිවාදී ධනවාදයේ රූපාකාරයන් හඹා යන නිසා ම ඔවුහු ඉබේ ම අඹ යහලුවෝ නොවෙති. මෑත වසරවල දී චීනය රුසියාව දෙසට කිට්ටු වී ඇත. නමුත් මෙම සන්ධානයට පැහැදිලි සීමාවන් ඇත. ඒවා ඇමරිකාවට ප්‍රයෝජනයට ගත හැකි වනවා ඇත."

මෙම වෙනස්කම් දැන් හෝ ඉදිරියේ දී එක්සත් ජනපදයට ඩැහැගත හැකි ද යන්න පසුව දැන ගත හැකි වනු ඇත. වොෂින්ටනයේ මිලිටරි ප්‍රතිපත්ති නිසා වූ අන්‍යොන්‍ය බිය හේතුවෙන් රුසියාව හා චීනය 1990 සිට "මූලෝපායික හවුලක්" ගොඩ නගාගෙන තිබේ. ඇමරිකාව නායකත්වය දුන් ඇෆ්ඝනිස්තාන් හා ඉරක යුද්ධ මැදපෙරදිග හා මධ්‍යම ආසියාවේ සම්පත් ආඪ්‍ය කලාපවල ඇමරිකානු ආධිපත්‍යය ස්ථාපිත කිරීම අරමුනු කරගත් ඒවා ය. වේගයෙන් ඉහල යන බල ශකති අවශ්‍යතාවයක් ඇති චීනයට මෙය දැඩි අවධානයට ලක් වූ කරුනකි. මධ්‍යම ආසියාවේ තම පසු භාගයන්හි (පිලිකනුවල) ඇමරිකානු අනුග්‍රාහක රාජ්‍ය හා මිලිටරි කඳවුරු නිර්මානයට රුසියාව හා චීනය යන රටවල් දෙක ම බිය වෙති.

චීනයේ උකුස් ඇස වන *ග්ලෝබල් ටයිම්ස්* සැප්තැම්බර් 1 දා ජෝරජියා ගැටුම්වලට සම්බන්ධ කරමින් රුසියාව සහ චීනය අතර සැකය හා අවිශ්වාසය ගොඩනැගීමට බටහිර බලවේගවලට අවශ්‍ය යයි අනතුරු හඟවයිඃ "මෙම බලවතුන් දෙදෙනා 'එකතු' වුවහොත් ඔවුන් සමග කටයුතු කිරීමට එක්සත් ජනපදයට බොහෝ දුෂ්කර වන නිසා මෙම තත්වය බටහිරට සහ එක්සත් ජනපදයට හොඳම වාසි ගෙනෙනු ඇත" ය පවසමින් රුසියාවට උගුල්වලට අසු නොවන්නැයි පත්තරය ලියයි.

විශේෂයෙන්ම යුරෝපය සමග තීව්‍රවන රුසියානු ආතතිය එක් ප්‍රධාන කාරනාවක දී චීනයට වාසි වනු ඇත. මිල සඳහා විකල්ප වෙලඳපොලක් ලෙස ද, යුරෝපීය විරුද්ධවාදීන්ට එරෙහිව මූලෝපායික කේවල් කිරීමට ද චීනය යොදා ගන්නා අතර ම යුරෝපය තම බල ශක්ති සැපයුම මත යැපෙන තත්වයට පත් කිරීම මොස්කව්හි මූලෝපාය වී තිබුන බව අගෝස්තු 19 දා *ඒෂියන් ටයිම්ස්* ලිපියක් පෙන්වා දුන්නේය. එබැවින්, කතාවට පමනක් සීමා වූ රුසියාව චීනයට බලශක්ති සැපයීම යථාර්ථයක් බවට පරිවර්තනය කර ගැනීමට හැකිවන බැවින් මෙලෙස තීව්‍රවන එක්සත් ජනපද-රුසියා ආතතිය "චීනයට මනාව ගැලපේ". "මෙම අවස්ථාවේ දී යුරෝපය හා රුසියානු සම්බන්ධතා අතර තවත් බර්ලින් තාප්පයක් ඉදිවන්නේ නම් දැවැන්ත බලශක්ති උරා බොන්නෙකු වන චීනයට එය ඉමහත් වාසියක් වනු ඇතැයි *ඒෂියා ටයිම්ස්* ලියයි.

ජෝර්ජියාව දකුනු ඔසෙටියාවට පහර දීමට යම්තම් සතියකට පෙර රුසියානු නියෝජ්‍ය අගමැති ඉගෝර් සෙචින් බලශක්ති සහයෝගිතාව පිලිබඳ රහස් සාකච්ඡාවකට බීජිනයට ගියේ ය. මේ පිලිබඳ තොරතුරු කාන්දු වී නොතිබුන අතර නිල චයිනා ඩේලි පුවත්පත උද්‍යෝගිමත් වියඃ "රුසියාන බලශක්ති අපනයන ප්‍රතිපත්තිවල පැද්දීමක් ආරම්භ වී ඇති බව පෙනෙයි. රුසියාව තම ඇස් බටහිර රටවල් වෙත සිට ආසියා පැසිෆික් කලාපය දෙසට හරවනු ඇත. දෙරටෙහි දේශපාලන හා භූගෝලීය කිට්ටුකම එම රටවල බල ශක්ති සහයෝගිතාව ආරක්ෂක සෙවනක් යට තබනු ඇත. එමෙන් ම එය දෙපැත්තට වාසිදායක ගනුදෙනුවක් වනු ඇත. චීන-රුසියා බැඳීම ඒවයේ හොඳම කාලයේ ය. දෙපැත්ත ඔවුන්ගේ දිගු කාලීන මායිම් මතභේද සමතයකට පත් කලෝ ය. ඒකාබද්ධ මිලිටරි අභ්‍යාසවල යෙදුනෝ ය. වේගයෙන් වර්ධනය වන්නා වූ ද්වි පාර්ශවික වෙලඳමේ රස වින්දෝ ය.

චීනය නියම මාවතක ගමන් කරයි. මෑත වසර වල රුසියාවේ ආර්ථික පුනර්ජීවනය බලශක්ති උත්පාතය මත පදනම් වී ඇත. කර්මාන්ත ව්‍යාප්තිය සඳහා වන වෙලඳපොල හා ආයෝජන සඳහා විශාල වශයෙන් එක්සත් ජනපදය හා යුරෝපය මත යැපෙන චීනය ලාභ ශ්‍රම වෙලඳපොලකි. රට තුල සාමාජ ස්ථාවරත්වය ශක්තිමත් කරන ගමන් ම වේගවත් ආර්ථික වෘද්ධියක් පවත්වා ගෙන යාම චීන නිලධාරින්ගේ ප්‍රධාන එල්ලය වී ඇත. චීන පාලනය ලෝකය වටා අමුද්‍රව්‍ය ආරක්ෂාව සොයන පරිදිම එය මහා බල අරගලයකට වේගයෙන් ඇදී යමින් පවතී. රුසියාව හා එක්සත් ජනපදය අතර වැඩෙන ආතතියට මැදිහත්වීම පිලිබඳව වැනෙන අතර ම රුසියාව දුරස්ත කර ගැනීමත් ජාත්‍යන්තර වේදිකාවේ හුදකලාවීමට ඉඩ හැරීමත් චීනයට දැරිය නොහැකි වනු ඇත.